# සාරාංශය

ප්‍රජානන සංවර්ධන

පියාජේගේ න්‍යායේ සදහන් වන ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින් තුළ සංරක්ෂණ සංකල්පය වර්ධනයේ ස්වභාවය පිළිබඳව ශ්‍රී ලංකාවේ මාතර දිස්ත්‍රික්කයේ ළමයින් සම්බන්ධ කර ගනිමින් සිදු කළ පරයේෂණයේ ප්‍රධාන අරමුණු තුනක් විය. ප්‍රමාණය, සංඛ්‍යාව, දිග, දුර, වර්ගඵලය සහ බර යන රාශීන් සම්බන්ධව සංරක්ෂණ සංකල්පය ශ්‍රී ලංකවේ ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින් වටහා ගන්නේ කෙසේදැයි අධ්‍යයනය මෙම පරයේෂණයේ එක් අරමුණක් විය. පරයේෂණයෙහි මීළඟ අරමුණ ශ්‍රී ලංකවේ ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින්, පියාජේගේ ස්විට්සර්ලන්ත ළමයින්ගේ අවධි මට්ටමේදී සංරක්ෂණ සංකල්පය වටහා ගනිද යන්න සෙවීම විය. ශ්‍රී ලංකාවේ ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින් සංරක්ෂණ සංකල්පය වටහා ගැනීමේදී, පියාජේගේ ස්වීට්සර්ලන්ත ළමයින් පිළිබඳව [illegible]ගැනීම් වලට වඩා කිසියම් වෙනසක් දක්වයිද යන්න පිළිබඳව අධ්‍යයනයද පරයේෂණයේ තවත් අරමුණක් විය.

ප්‍රමාණය, සංඛ්‍යාව, දිග, දුර, වර්ගඵලය සහ බර යන සංකල්ප සම්බන්ධයෙන් සංරක්ෂණ හැකියාව පරික්ෂා කිරීමේදී භාවිතා කරනු ලැබුවේ පියාජේ විසින් ස්වීට්සර්ලන්ත ළමයින්ගේ සංරක්ෂණ හැකියාව සෙවීම සදහා භාවිතා කළ පරීක්ෂණයි එබදු සම්මත පරීක්ෂණ හතක් ඉහත සදහන් කරන ලද. එක් එක් සංකල්පය පිළිබද සංරක්ෂණ හැකියාව පරීක්ෂා කිරීමේදී පිළිවලින් ක්‍රියාත්මක කරනු ලැබිණ. ශ්‍රී ලංකාවේ වසය අවුරුදු හතර සිට අවුරුදු හත දක්වා වූ වයස් සීමාවේ පසුවන සියළුම ළමයින් ප්‍රතිභා චින්තන අවධියට අයත් විය. අධ්‍යයනය සදහා නියමිතව තිබූ කාලය සහ පිරිස සැලකිල්ලට ගත් විට පරයේෂණය අංශ කිහිපයකින්ම සීමා කිරීමට සිදු විය. ඒ අනුව නියදිය තෝරා ගැනීමේදී ප්‍රථමයෙන්ම අහුඹු නියදිකරණය මගින් දිස්තික්කයක්ද, එම දිස්තික්කයට අයත් වූ අධ්‍යාපන කලාපයක්ද, එම කලාපයට අයත් වූ අධ්‍යාපන කොට්ඨාශයක්ද තෝරා ගැනිනි. නැවතත් අහඹු නියැදිකරණය යොදා ගනිමින් කොට්ඨාශයට අයත් පළමු වසරේ සිට පන්ති පැවැත්වෙන පාසල් අතුරින් එක් පාසලක් තෝරා ගනු ලැබිණ. ඒ අනුව අහඹු නියදිකරණය මගින් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස කලාපයට අයත් මාලිම්බඩ අධ්‍යාපන කොට්ඨාශය තුළ පිහිටි දම්පැල්ල කනිෂ්ඨ විදුහල තෝරා ගැනිනි. අවුරුදු හතර සිට අවුරුදු හත දක්වා වයසේ පසුවූ ළමයින් පරයේෂණයට සම්බන්ධ කර ගත යුතු වූ බැවින් වයස අනුව ළමයින් ස්ථර තුනකට වෙන් කර ගැනින. පහලම වයස් ස්ථරය නියෝජනය වූයේ වයස අවුරුදු හතර සිට අවුරුදු පහ දක්වා වූ ළමයින් ගෙනි. එම ළමයින් පාසල් නොයන වයසේ පසු වූ නිසාත් එකම භෞතික, සමාජ පරිසරයක ළමයින් අධ්‍යයනය සදහා යොදා ගතයුතු වූ බැවින්ද දම්පැල්ල ග්‍රාමයේ එවකට තිබූ එකම පෙර පාසල වූ ගයා පෙර පාසලේ ළමයින් සම්බන්ධ

කර ගැනීමට සිදු විය. ස්ථරායන අහඹු නියැදිකරණය යොදා ගෙන වයස් ස්ථර තුනෙන් සමාන සංඛ්‍යාවක් බැගින් නියදිය සදහා තෝරා ගන්නා ලදි. නියාමක නියදිය සදහා ළමයින් සය දෙනෙක්ද, නියදිය සදහා ළමයින් දහ අටක්ද, ඇතුලත් විය.

නිරීක්ෂණය, පර්යේෂනයේදී දත්ත රැස් කිරීම සදහා යොදාගත් ප්‍රධාන ක්‍රම ශිල්පය විය. එ බැවින් නියාමක පරීක්ෂණ පැවැත්වීම මෙම පර්යේෂනයේදී අත්‍යවශ්‍ය වු අතරම නියාමක නියදිය සදහා නියමු පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව එම අත්දැකීම්ද සැළකිල්ලට ගනිමින් නියදිය සදහා පරීක්ෂණ පවත්වන ලදී. දත්ත විශ්ලේෂණයේදී වගු, තීර ප්‍රස්ථාර සහ ප්‍රතිශත යන ක්‍රම භාවිතා කරන ලදී. ලැබුණ ප්‍රතිඵල අනුව ප්‍රතිභා චින්තන අවධියේ ළමයින් දිග, දුර, වර්ගඵලය සහ බර යන සංකල්ප යන්හි සංරක්ෂණ හැකියාවක් කොහෙත්ම පෙන්නුම් නොකරන ලදි. පිහිටීම, හැඩය වැනි භෞතික ලක්ෂණ වෙනස් වන විට එම වස්තුවේ දිග, දුර, වර්ගඵලය හා බර වෙනස්වන බව ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින් නිගමනය කරන ලදි. ප්‍රතිභා චින්තන අවධියේ පසුවන ළමයින් ගෙන් කොටසක් පමණක් ප්‍රමාණය, සංඛ්‍යාව යන සංකල්පය හා සම්බන්ධව සංරක්ෂණ අවබෝධයෙන් යුතු විය. එම ළමයින් සියළු දෙනාම ප්‍රතිභා චින්තන අවධියේ අවසාන භාගයේ පසු විය. ප්‍රතිභා චින්තන අවධියේ ආරම්භයේ පසුවන ළමයින් ප්‍රමාණය, සංඛ්‍යාව ආදිය පිළිබඳව සංරක්ෂණ අවබෝධයෙන් තොර විය.